දිස්ත්‍රික් ලේකම් කාර්යාලය -කුරුණෑගල
மாவட்டச்செயலகம் - குருநாகல்
DISTRICT SECRETARIAT- KURUNEGALA

මගේ අංකය / எனது இலக்கம் / My No: DSKU/ADM/ES/KGUNS/2/7

ඔබේ අංකය / உமது இலக்கம் / Your No:

දිනය / திகதி / Date: 2024.10. 07

මහත්මයාණෙනි,මහත්මියනි,මෙනවියනි,

තුවක්කු ආඥා පනතේ 05 (1) හා 23 (3) වගන්තිවල විධිවිධාන ප්‍රකාර 2025 වසර සඳහා තුවක්කු බලපත්‍ර අලුත් කිරීම.

2025 වසර සඳහා ගිනිඅවි බලපත්‍ර අළුත් කිරීම් කටයුතු 2024.09.01 දින සිට ක්‍රියාත්මක කරනු ලැබේ. ඒ අනුව මේ සමඟ එවා ඇති ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කර ඔබ පදිංචි ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී නිර්දේශය සහ එම ග්‍රාම නිලධාරී කොට්ඨාසය අයත් ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය සහිතව ඔබ පදිංචි පොලිස් බල ප්‍රදේශයේ පොලිස් ස්ථානාධිපති මඟින් හා කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයාගේ නිර්දේශයන් ද සමඟ මා වෙත ඉදිරිපත් කර, සතියේ කාර්යාල දිනයන්හි දී පෙ.ව.9.00 සිට ප.ව.3.00 දක්වා පැමිණ ගිනිඅවි බලපත්‍රය අලුත් කර ගන්නා මෙන් කාරුණිකව දන්වා සිටිමි. මෙම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් වගා ආරක්ෂාව,සත්ත්ව පාලනය හා දේපල ආරක්ෂාව යඳහා ගිනිඅවි බලපත්‍ර අලුත් කිරීම සිදු කරනු ලබන්නේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ස්ථිර පදිංචි ගිනිඅවි හිමිකරුවන්ගේ පමණක් වන අතර, ගිනිඅවි බලපත්‍රය නිකුත් කරනු ලබන්නේ ගිනිඅවි හිමිකරු වෙත පමණක් බවද සැලකුව මැනවි.

02. 2025 වර්ෂයේ ගිනි අවි බලපත්‍රය 2024.12.31 දිනට පෙර අලුත් කර ගැනීම සිදු කළ යුතු අතර, වාර්ෂික බලපත්‍ර අලුත් කිරීමෙන් තොරව ගිනි අවියක් ළඟ තබා ගත හැකි උපරිම කාලසීමාව දින **10ක්** පමණි. එබැවින්, නියමිත කාලසීමාව තුළ ඔබ විසින් අයදුම්පත්‍රය භාර දී ඇති නමුත්, 2025.01.10 දින වන විටත් බලපත්‍රය ලබාගැනීමට නොහැකි වන සෑම ගිනි අවියක්ම තාවකාලිකව ආසන්නතම පොලිස් ස්ථානය වෙත භාර දීමට කටයුතු කළ යුතුය. එසේ භාර දුන් බවට ලිපියක් පොලිස් ස්ථානයෙන් ලබා ගත යුතු අතර, ගිනිඅවි බලපත්‍රය ලබා ගැනීමට පැමිණෙන විට එම ලිපියේ මුල් පිටපත ද රැගෙන ඒම අනිවාර්ය වේ.

1. ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ඉදිරිපත් කළ යුතු ලේඛන
   - i. පදිංචි වසමේ ග්‍රාම නිලධාරීගේ නිර්දේශය සහිත ඉල්ලුම් පත්‍රය
   - ii. වාර්ෂික බලපත්‍රය අලුත් කරනු ලබන්නේ,

වගා ආරක්ෂාව සඳහා නම් - ආකෘතිය A භාවිතා කරන්න

- වගා කටයුතු සඳහා යොදා ගන්නා අදාල ඉඩම් එකම දිස්ත්‍රික්කයක් තුළ පිහිටා තිබිය යුතුය. **ඉඩම් සහ පදිංචිය දිස්ත්‍රික්ක දෙකක පිහිටා තිබේ නම් මුරකරු බලපත්‍රයක් ලබා ගැනීම සිදු කළ යුතුය.**

- බලපත්‍රලාභියා සතු වගා ඉඩම් පදිංචි දිස්ත්‍රික්කයෙන් පිටත පිහිටා තිබේ නම්, එම ඉඩම් පිහිටි වසමේ ග්‍රාම නිලධාරී/ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර හෝ කෘෂිකර්ම උපදේශක විසින් ඉඩම් පිළිබඳව, ඉඩමෙහි වගා කටයුතු කරනු ලබන බවට හා වගා හානි සිදුවන බවට සහතිකයක් අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතුය.

- අයදුම්කරු/කලත්‍රයා සතුව අක්කර 05 කට නොඅඩු ඉඩම් ප්‍රමාණයක් පැවතිය යුතු අතර, අදාළ ඔප්පු පිටපත් අයදුම්පත් ඉදිරිපත් කරන අවස්ථාවේ දී ග්‍රාම නිලධාරී/ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය. මීට අමතරව ග්‍රාම නිලධාරී/ප්‍රාදේශීය ලේකම් විසින් ඉල්ලා සිටින අවස්ථාවල දී ඉඩමේ වර්තමාන අයිතිය පත්ඉරු මඟින් තහවුරු කිරීමට කටයුතු කළයුතු බව ද කාරුණිකව දන්වමි.

- **2023.03.29** ට පෙර කාලසීමාවේ දී ලබාගත් ගිනිඅවිවලට පමණක් බලපත්‍ර අලුත් කිරීමේ දී වගා ඉඩම් අක්කර 2 ක් සඳහා බලපත්‍ර අලුත් කළ හැක. බලපත්‍රය අලුත් කිරීමේ උපරිම වයස් සීමාව අවු.70 වේ.

දිස්ත්‍රික් ලේකම් / District Secretary / மாவட்ட செயலாளர் - දුරකතනය / Telephone / தொலைபேசி: 037-2222235
ෆැක්ස් / Fax. / தொலை நகல்: 037-2222134
ඊ මේල් / E mail / மின்னஞ்சல்: disecku@sltnet.lk

පොදු / General / பொது - දුරකතනය / Telephone / தொலைபேசி: 037-2222238, 037-2227875
ෆැක්ස් / Fax. / தொலை நகல்: 037-2222926
ඊ මේල් / E mail / மின்னஞ்சல்: districtkur@gmail.com

වෙබ් අඩවිය /Web site/ இணையத்தளம் : http://www.kurunegala.dist.gov.lk

<u>සත්ත්ව පාලනය සඳහා නම් - ආකෘතිය A භාවිතා කරන්න</u>

- **කුකුල් ගොවිපලක නම් අවම ලෙස කුකුළන් 3000ක් සිටිය යුතු අතර, අනෙකුත් සත්ත්ව ගොවිපලවල් සඳහා ගොවිපලේ සිටිය යුතු අවම සතුන් ප්‍රමාණය 200 විය යුතුය.**
- සත්ත්ව ගොවිපල ලියාපදිංචි කිරීමේ සහතිකය අමුණා තිබිය යුතුය.
- බලපත්‍රය අලුත් කරන දිනට සිටින සතුන් ප්‍රමාණය සඳහන් කරන ලද ග්‍රාම නිලධාරී සහතිකය අමුණා තිබිය යුතුය.

<u>දේපළ ආරක්ෂාව සඳහා නම් - ආකෘතිය B භාවිතා කරන්න</u>

- ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ සහතිකය හා යාවත්කාලීනව ආදායම් බදු ගෙවන බවට වාර්තා ඉදිරිපත් කළ යුතුය.

02. <u>වයස අවුරුදු 70 ඉක්මවූ පුද්ගලයන් සඳහා ගිනිඅවි බලපත්‍ර අලුත් කිරීම</u>

- ගිනිඅවියක් භාවිතා කිරීමට සුදුසු කායික හා මානසික තත්ත්වයකින් පසුවන බවට රජය පිළිගත් වෛද්‍යවරයෙකුගෙන් ලබාගත් වෛද්‍ය සහතිකයක් (H ආකෘතිය) මත වයස අවු.**70-75** අතර පුද්ගලයින්ගේ කෘෂිකාර්මික සහ දේපළ කටයුතු සඳහා ලබා දී ඇති ගිනිඅවි බලපත්‍ර අලුත් කිරීම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් සිදු කර ගත හැක.

- වයස අවු. 75 ට වැඩි, ගිනිඅවි හිමිකරු නමින්ම බලපත්‍ර ලබාගන්නා පුද්ගලයින් සඳහා සියලුම වර්ගයේ ගිනිඅවි බලපත්‍ර අලුත් කිරීමේ දී (H ආකෘතිය සමග) දිස්ත්‍රික් ලේකම්ගේ නිර්දේශය සහිතව ආරක්ෂක අමාත්‍යාංශ ලේකම් මඟින් සිදු කර ගැනීමේ හැකියාව ඇත.

- වයස අවු. 75 ට වැඩි මුරකරු බලපත්‍රයක් යටතේ බලපත්‍ර ලබා ගැනීමට එකඟතාවය දක්වන පුද්ගලයින් සඳහා, කෘෂිකාර්මික හා දේපළ ආරක්ෂාව සඳහා භාවිතා කරන ගිනිඅවි මුරකරු බලපත්‍රයක් යටතේ භාවිතා කිරීමට යටත්ව බලපත්‍ර අලුත් කිරීමේ හැකියාව ඇත. එහිදී මුරකරුගේ වයස **අවු. 65 නොඉක්ම විය** යුතු අතර **<u>මෙහිදී ගිනිඅවි හිමිකරුට ගිනි අවිය භාවිතා කළ නොහැක</u>.**

03. **<u>ගිනි අවි පැවරීම</u>**

- වයස අවු. 70 ට වැඩි ගිනිඅවි හිමිකරුවන් වයස අවු.75 ඉක්මවීමට පෙර ගිනිඅවි පැවරීමේ කටයුතු සිදු කළ යුතු අතර, නොඑසේ නම් මුරකරු බලපත්‍රයක් යටතේ පමණක් ගිනිඅවිය භාවිතා කළ යුතුය.
- පවරන්නාගේ අවම වයස් සීමාව වයස අවු. 21 ඉක්මවිය යුතුය.
- ගිනිඅවි පැවරීමේ දී සත්‍ය වශයෙන් ම වගා කරනු ලබන ඉඩම් ප්‍රමාණය **අක්කර 02 ක්** ලෙස සැලකිය යුතුය..

04. **<u>2025 වර්ෂයට බලපත්‍ර අලුත් කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතු ලේඛන</u>**

i. පසුගිය වර්ෂයේ ගිනිඅවි බලපත්‍රයේ මුල් පිටපත.
ii. ජාතික හැඳුනුම්පත හෝ වලංගු රියදුරු බලපත්‍රය.
iii. පදිංචිය වෙනස් වී ඇත්නම් එය සනාථ කිරීම සඳහා ග්‍රාම සේවා සහතිකය ඉදිරිපත් කළ යුතුයි.

05. **<u>පොදු උපදෙස්</u>**

- ඔබගේ ගිනිඅවි බලපත්‍රය අලුත් කිරීමේ අයදුම්පත්‍රය, පොලිස් අධිකාරී කාර්යාලයෙන් මෙම කාර්යාලය වෙත එවීමෙන් පසුව ගිනිඅවි බලපත්‍රය අලුත් කිරීම සඳහා පැමිණිය යුතුය.

- පිස්තෝල, රිවෝල්වර්, ක්‍රීඩා කටයුතු සඳහා භාවිතා වන ශීනිඅවි, පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යායතන වෙත නිකුත් කර ඇති සියලුම ගිනිඅවි සහ ජීවිත හා දේපළ ආරක්ෂාව සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට හා රජයේ ඉහළ නිලධාරීන්ට නිකුත් කර ඇති රිපීටර් සඳහා බලපත්‍ර නිකුත් කිරීම ආරක්ෂක අමාත්‍යාංශය මඟින් සිදු කරනු ලැබේ.

- දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත 2024.12.31 දිනට ප්‍රථම අයදුම්පත්‍රය ඉදිරිපත් කර බලපත්‍රය අලුත් කර ගත යුතුය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් සඳහා වාර්ෂික බලපත්‍ර ගාස්තුවට සමාන **දඩමුදලක්** ගෙවිය යුතුය.

ඉහත උපදෙස් පරිදි කටයුතු කර ඔබ සන්තකයේ පවතින ගිනිඅවි සඳහා වන ගිනිඅවි බලපත්‍ර 2025.01.10 ට දිනට පෙර අලුත් කර ගැනීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි. තව ද නියමිත කාලසීමාව තුළ ගිනිඅවි බලපත්‍ර අලුත් කිරීම පැහැර හරින ගිනිඅවි බලපත්‍රලාභීන් සම්බන්ධ තොරතුරු ගිනිඅවි ආඥා පනත ප්‍රකාරව නෛතික ක්‍රියාමාර්ග ගැනීම සඳහා අදාළ කොට්ඨාසභාර පොලිස් අධිකාරීන් වෙත වාර්තා කරනු ලබන බව ද කරුණාවෙන් සලකන්න.

ආර්.එම්.ආර්.රත්නායක,
කුරුණෑගල දිසාපති/දිස්ත්‍රික් ලේකම්
හා ස්වදේශ කටයුතු අතිරේක ලේකම්

දුරකතන අංකය	:	037-2222235
ෆැක්ස් අංකය	:	037-2222134
විද්‍යුත් තැපෑල	:	moha.dist.kurunegala@gmail.com

පිටපත් : 01. දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් - කා.දැ.ගැ හා අවශ්‍ය කටයුතු සඳහා
02. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී - කුරුණෑගල/කුලියාපිටිය/නිකවැරටිය - කා.දැ.ගැ හා අවශ්‍ය කටයුතු සඳහා